# නිහඬ මෙහෙවරක සටහනක්

අයිරාංගනි අබේරත්න

මුදු හද පත්ලක උපදින කරුණාවේ සිසිලස අඳ නෙතටද පෙනී, බිහිරි සවනතට ද ඇසී, ගොළු මුවින් ද තුති පිදුම් ලබන්නේ ය. ඒ උත්තම මිනිස් ගුණයෙන් පිරිපුන් වූ මෙල්බන් පුරවරයේ හැබෑම මානව හිතවාදීන් පිරිසක් පසුගිය දෙසැම්බරයේ එක්තරා දිනකදී ඉතා සුවිශේෂි වූ පරහිතකාමී කාර්යයභාරයක් වෙනුවෙන් පහන් සිතින් ඒකරාශි වූහ. මිනිසත් බවේ ගුණ සුවඳ හඳුනා ජීවත්වෙන, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම පරාර්ථකාමය උදෙසා කැපවූ මේ සුහද හිත මිතුරෝ අල්පමාත්‍ර වුද ලාභ ප්‍රයෝජනයක් නොපතා දිවා රෑ නොබලා වෙහෙසී මේ නිහඬ පුණ්‍යවන්තත මෙහෙවර සඳහා දායක වූවෝය.

මුදල පසුපසම හඹායන, එකිනෙකා පරදවා ලන තරඟයක නියැළී සිටින නිස්සාර වූ වර්තමාන සමාජයේ මිනිස් ගුණදම් සුරැකී ඇති සුවඳැති හදවත් තවමත් ඉතිරි වී ඇති බවද ඔවුහු අද අපට පසක් කර දී තිබේ.

අණබෙර නොගසා ආත්ම වර්ණනා නොපතා හෘද සාක්ෂියට එකඟව තම කාළය, ශ්‍රමය හා ධනය සුහද සිතින් කැපකරමින් එකමුතු වූ මේ කළණ මිතුරෝ එළ බී පසුගිය දෙසැම්බර් මාසයේ දිනක යළිත් එක්සේසත් වූයේ ඉතා අර්ථ පූර්ණ, ප්‍රශංසා සහගත නිහඬ සත්කාරයක් සඳහාය.

මනා සංවිධායකින් යුතුව සියළු කාරණා කටයුතු සම්පාදනය කරගෙන මහා පරිමාණ යේ භෝජන සංග්‍රහයක් සැළසුම් කරන ලදුව එහි සම්පූර්ණ බරපැණ ඔවුනොවුන් අතරේ සාමුහිකව බෙදා ගත් සුපසන් හිතවතුන් කැල වීර්යය ධෛර්යය හා සහයෝගය පෙරදැරි කරගෙන මේ ක්‍රියාදාමයේ සාර්ථකත්වය වෙනුවෙන් සද්භාවයෙන් යුතුව ඇපකැප වූවෝය.



දෘඪතර බැදීමෙන් එකාවන්ව වෙහෙසී ඇති සාර්ථකව නිම කරගත් මේ විසල් භෝජන සංග්‍රහය අවසානයේදී අත්‍යවශ්‍ය උපාංග වලින් සමන්විත විශේෂ වෑන් රථයක් මිළදී ගැනීමට සහ අනෙකුත් අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් වූ අරමුදලක් එක් රැස්කර දීමට ඔවුහු සමර්ථ වූහ.

ජීවිත කාලය පුරා සියතින් සිදුකෙරුනු සුවහසක් පරහිතකාමී යහපත් ක්‍රියාවන් දිව්‍යමය ආශිර්වාදය වි සහෘද හිතවතුන්ගේ ප්‍රති උපකාර ලෙස ආපිට ලැබුණු අයුරු පහන් සිතින් සිහිකරන අයිරාංගනි අබේරත්න කෘතගුණ පූර්වකව නෙත නැගි කඳුලින් යුතුව හිත මිතුරන්ගේ කුළුනුබර දයකත්වයට ප්‍රණාමය පුදකර සිටි.

තමා නිබඳ කැපවුනු සුපසන් සමාජ සත්කාරයේ ගැඹුර සහ වටිනාකම නිසිලෙස හඳුනාගත් සහෘදයන්ගේ සහෝදරත්වය,



කරුණාව සහ පරිත්‍යාගශිලිත්ව ය සිය ඉදිරි කටයුතුවලට ලබාදුන් පත්තරය ගැන ද කෘතවේදි ව සඳහන් කරන ඇයගේ ඒකායන ප්‍රාර්ථනය සිය පවුලේ සැමගේත් සහෝදර හිතවතුන්ගේත් සුහද සහයෝගය මඟින් තම නොනිමි සමාජ සත්කාරය නොකඩවා ඉදිරියට ගෙනයාමයි.

එක් කුස ඔත් සොයුරන් සේම ලබැඳි සෙනෙහසින් පිළිසරණට සපැමිණි ආදරණීය හිතවතුන්ගේ පරමාරදර්ශි සමාජ මෙහෙ වරට කෘතගුණ පූර්වකව ආශිර්වාද කරන අයිරාංගනි අබේරත්න ඇතුළු පවුලේ සෑම ඒ පින්බර දෑත් වලට මතුවටත් මෙවන් සත්කාරයක් කිරීමට යෝධ බල යෝධ ශක්තිය ලැබී, ඉදිරිමඟ යහපත්ම වේවා ! යි සෙනෙහසින් සුභාශීංසනය කරති.

## විනී හෙට්ටිගොඩ




14 වන පිටෙන්

සත්‍ය නිදර්ශකයක් සහ ඡායාරූපද සහිතව මෙම අද්භූත දෙබිඩි පොල් පිලිබඳ ඔවුන් දැනුවත් කිරීම පිළිබඳව මට කිහිප දෙනෙක්ම ස්තුති කළහ.

පසුව එළඹී සාකච්ඡා වාරයේදී, එක් ශිෂ්‍යාවක් මෙසේ ප්‍රශ්නයක් නැගුවාය.

"ඔය කියන පාරාදීස දිවයින් වල පමණක් ස්වාභාවිකව වැවෙන ගස්වල හටගන්නා දෙබිඩි පොල් ආදම් සහ ඒව ගේ යයි සැලකෙන ආකෘති නිරූපණය කරන නිසා, මේ පොල් වලට යෙදිය යුතු හොඳම නම එලොව පොල් නේද?

මෙම ප්‍රශ්නයට මගේ පිළිතුරක් දිමට ප්‍රථමෙ යන් එලොව පොල් පෙනීම යන ජන වහර පිලිබඳ පැහැදිලි කිරීමක් කරන ලෙස මම, මා අසලම වාඩිවී සිටි විදුහල්පති තුමාට ආරාධනා කළෙමි.

විදුහල්පතිතුමාගේ පැහැදිලි කිරීම මෙසේය.

"අපගේ ගැමි වහරෙහි හැටියට එලොව පොල් පෙනුනා යයි කියන්නේ යම්කිසි බැරි බරක් හිසට දමාගෙන එය කෙසේ හෝ අවසන් කිරීමෙන් පසු දැනෙන වෙහෙස විස්තර කිරීම සඳහාය. මෙය හිස මතට ඇත්ත වශයෙන්ම වැටුණු බරක් හෝ මනසට ඇතුල්වූ උභතෝකෝටික ප්‍රශ්නයක් විය හැකිය. බර සැහැල්ලු කරගත් පසු හෝ මනසේ ගැටලුව විසඳා ගත් පසු, එලොව පොල් පෙනුන බව, බොහෝ විට ප්‍රකාශ කරති. එම කාර්යය කරගෙන යාමේදී සිතෙහි ව්‍යාකුල භාවය නිසා ඇතිවන මානසික අසහනය විස්තර කිරීම සඳහා එසේ පවසනු අප අසා තිබේ.
එම කියමන, හරිහැටි විස්තර කිසිවක් නොදන්නා, අතාත්වික ස්ථානයක් වන එලො වෙහි තිබේයයි සිතන, පොල් විය හැකිය. එහෙත් මේ සඳහා කොස්, වට්ටක්කා, කොමඩු වැනි වෙනත් විශාල ගෙඩි වර්ගයක් නොගෙන පොල් පමණක් යොදා ගන්නේ එහි සැඟවුණු අර්ථයක් තිබෙන නිසාම විය හැකිය. මෙම සැඟවුණු අර්ථය ගැන පොතපතින් තවදුරටත් තොරතුරු සෙවීම ඔබ සැමට තවත් අගනා ව්‍යාපෘතියක් ලෙස කළ හැකි වේයයි සිතමි." යනුවෙන් විදුහල්පති තුමා තම පැහැදිලි කිරීම අවසන් කළේය.

මේ ගැන තව දුරටත් විස්තර කිරීම මා වෙත පැවරුණි. විදුහල්පතිතුමා කළ විස්තරයට මා ඌණ පුරණයක් කළේ මෙසේය.

"කෙසේ වෙතත්, බැරි බරක් හිස මත තබා ගැනිම වැනි අදහස සඳහා සාමාන්‍ය බරකින් යුක්ත පොල් ගෙඩියක් ගැන සිතීමට කිසිම හේතුවක් නැත. බර ගැන සිතුවොත් කොස් ගෙඩියක් සාමාන්‍ය පොල් ගෙඩියකට වඩා විසි තිස් වාරයක් බරින් වැඩිය. එහෙත් කිසි විටෙකත් එලොව කොස් පෙනුනා යයි ජන වහරක් නොමැතිය."

"මේ නිසා මෙලොව සිටින අය ව්‍යවහාරයේදී භාවිත කරන එලොව පොල් අපගේ සැලකිල්ලට භාජන වන දෙබිඩි පොල් විය නොහැකිද? මෙහි එලොව වශයෙන් සඳහන් වන්නේ, තිබේ යයි බොහෝ අය විශ්වාස කරන, එහෙත් කිසිවෙකු විසින් දැක නොමැති දිව්‍යලෝක, බ්‍රහ්ම ලෝක, ප්‍රේත ලෝක. අපාය වැනි ස්ථාන නොවේද?

මේ අතින් බලන කළ, වසර දෙසියයකට පමණ ඉහතදී සිට වරින් වර දකින්නට ලැබුණු එහෙත් පැමිණෙන්නේ කොහි සිටද යන්න නොදත් නිසා, එකළ ජනතාව මෙම දෙබිඩි පොල් එලොව පොල් වශයෙන් සිතන්නට ඇත. මේ නිසා එලොව පොල් පෙ නුනා යන යෙදුම දෙබිඩි පොල් නිසා ජන වහරට එන්නට ඇතැයි සැක කළ හැකිය."
මගේ පැහැදිලි කිරීම කාගේත් හාස්‍යයට හේතු වූ කරුණක් බව කාගේත් මුහුණු වලින් දකින්නට ලැබිණ.

සීෂෙල්ස් දුපත් වාසීහු දෙබිඩි පොල් වලට පහත දැක්වෙන අයුරු දේව කථා රාශියක් සම්බන්ධ කර ගෙන ඇති බවද පෙනේ.

- දේව බලයක් සහිත මෙම අද්භූත ශාකයේ පරිණත ගෙඩිය (බීජය), ලෙල ඉවත් කල පසු, කාන්තාවකගේ උකුල් ප්රෑදේශයේ හැඩය ගැනීමත්, පුං ශාකයේ හටගන්නා පුෂ්ප මංජරිය පුරුෂ ලිඟුවක හැඩය ගැනීමත් දේව බලය නිසා සිදුවූ බව විශ්වාසයයි.
- මෙම දිවයින් සඳහා පාරාදීස දිවයින් (Islands of Paradise) යන අන්වර්ථ නාමයක්ද පට බැඳී තිබෙන්නේ දේව කතා වල විස්තර කෙරෙන ආදම් සහ ඒව මෙම දිවයින් වල විසූ බව විශ්වාස කරන නිසාය.
- මෙම ශාක ගොණුවේ තිබෙන පරිණත පුං සහ ජායා ශාක, වසන්ත සමයේ පුන්සඳ පායා තිබෙන රාත්‍රී කාලයේදී, නැමී එකිනෙක ආලිංගනය කරගන්නේ දේව අනුහසින් බවත්, ආදම් සහ ඒව තම ආත්මයේ ජෛව සංකේත මෙම ශාක වලට ආරූඪ කළ බවටද මතයක් තිබේ.

මෙම විශ්වාස නිසා දැනටද සීෂෙල්ස්හි ගැමියන් අතර දෙබිඩි පොල් පිළිබඳව විශාල භක්තියක් තිබේ. ඔවුන් එයට වැඳුම් පිදුම් නොකළත් එය අනර්ඝ වස්තුවක් ලෙස සලකති. ඔව්හු මෙම පොල් ගෙඩියක් බිඳීමටවත් අකමැතිය. මෙම පොල් ගෙඩියේ මද කෑ කෙනෙකුට එහි පොල් කටුවම භාවිත කර සිඟමන් යැදීමට සිදුවන බව එරටෙහි පැරැන්නෝ තදින් විශ්වාස කරති.

මේ සියලු විශ්වාසයන් නිසා සීෂෙල්ස්හි ප්‍රාලේ දුපතේ පමණක් තිබෙන දෙබිඩි පොල් වනාන්තරය දැඩි රක්ෂිතයක් ලෙස නිරුපද්‍රිතව පවතී. අද, මෙම භූමිය ලෝක ජෛව විවිධත්ව උරුමයකි. Lodoicia maldivika (seychellarum) ශාකය ස්වාභාවික හේතු නිසා වඳවීයාමේ තර්ජනයට මුණ පා ඇති ශාකයක් ලෙස ජාත්‍යන්තර සොබාදහම සංරක්ෂණ සංගමය (International Union for Conservation of Nature )IUCN) ඔවුන්ගේ රතු දත්ත පොතෙහි සඳහන් කර තිබේ.

පරිණත දෙබිඩි පොල් බීජයක් ප්‍රරෝහණය වී පැළයක් හට ගැනීම සඳහා වසර විස්සක් පමණ ගතවේ. එසේ ලැබෙන පැළය වැඩී පරිණත ශාකයක් වීමට තවත් වසර විස්සක් පමණ අවශ්‍යය. සාර්ථක පුෂ්ප සංසේච නයෙන් පසු හටගන්නා ඵලයක් පරිණත වීම සඳහාද තවත් වසර විස්සක් පමණ ගතවන බවද ගණන් බලා තිබේ. එසේම ගසක, වසර සියයක පමණ ආයු කාලය තුළදී ගෙඩි හත අටකට වඩා හට නොග නී. මෙයින්ද පරිණත තත්වයට පත්වනුයේ ගෙඩි කිහිපයක් පමණක් බවද අධ්‍යයනය කර තිබේ. මෙයට අදාළ තවත් සුවිශේෂී සිද්ධියක් වනුයේ මෙම ශාකයේ බිජ ප්‍රරෝහණය වීම සහ බිජ පැළ වර්ධනය සඳහා මෙම දූපතේ පසෙහි පමණක් සිටින, මෙම ශාකයටම ආවේණික සහජීවී බැක්ටීරියා (symbiotic bacteria) විශේෂයක සම්බන්ධයද තිබිය යුතු බවද අනාවරණය වී තිබේ. මේ නිසා මෙම අද්භූත ශාකය සංරක්ෂණය කර ගැනීම සඳහා විවිධ විද්‍යාත්මක ක්‍රමවේදයන් භාවිත කිරීමට සහ බීජ රටෙන් පිටතට ගෙනයාම වැලැක්වීම සඳහා විධිමත් ක්‍රමෝපායයන්ද යොදා තිබේ.

ස්වභාව ධර්මයේ තිබෙන මෙවැනි ආශ්චර්යමත් සංසිද්ධීන් හඳුනා ගැනීම සඳහා විද්‍යාත්මක විසඳුම් සෙවීම විනා, වෙනත් අද්භූත බලවේග වල එල්බ සිටීම නම් මුලාවකි.

**(ඡායා රූප කිහිපයක් සහ සමහර තොරතුරු, ස්තුති පූර්වකව, අන්තර්ජාලෙයනි)**